**ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ගනුදෙනු වාර්තාව - 2019**

---

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම් වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තාද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධන ගණන්දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2. විගණන නිරීක්ෂණ**

---

**2.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදිය අනුකූල නොවීම**

---

| | නීති, රීති සහ රෙගුලාසි ආදිය සඳහා යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1979 දෙසැම්බර් 20 දිනැති අංක 121/1979 දරන කාර්යාල චක්‍රලේඛයේ 2 (ඇ) ඡේදය | ඇණවුම් සමඟ චෙක්පත් මගින් අත්තිකාරම් ලබා දුන් විට එවැනි අත්තිකාරම් දින 30 ක කාලයක් තුළ පියවිය යුතුය. කෙසේ වුවද, 1999 සිට 2019 දක්වා කාල පරිච්ඡේදයට අදාළ එකතුව රු.175,470,650 ක් වූ අත්තිකාරම් සංස්ථාව විසින් නිරවුල් කර නොතිබුණි. තවද, ව්‍යාපෘතියක් ලෙස | නිරවුල් කිරීමේ ප්‍රමාදය සංස්ථාවේ ආයතනික මට්ටමේ පරීක්ෂාවට ගෙන ඇති අතර වත්මන් අංක 121/1979 චක්‍රලේඛය අනුව සුදුසු ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වේ. උපදෙස් සහිත නව චක්‍රලේඛයක් සමග ඉක්මනින් නිරවුල් කර ගැනීම සඳහා | හිඟ මුදල් ශේෂය කිසිදු ප්‍රමාදයකින් තොරව අය කර ගත යුතු අතර සංස්ථාව මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | සංස්ථාව යටතේ ක්‍රියාත්මක වූ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ (NEMO) 2016 සිට 2019 දක්වා රු.6,445,194 ක් වූ ඇණවුම් සමග චෙක්පත් අත්තිකාරම් නිරවුල් නොවී පැවතුනි. | ක්‍රියා කරමින් පවතී. | |
| (ආ) | 1979 දෙසැම්බර් 20 දිනැති අංක 121/1979 කාර්යාල චක්‍රලේඛයේ 4 වන ඡේදය | සේවා හෝ භාණ්ඩ සැපයීම සඳහා මුදල් අත්තිකාරම් ලබා දුන් පසු එම අත්තිකාරම් දින 14 ක් තුළ පියවිය යුතුය. කෙසේ වුවද, රු. 22,016,960 ක මුදල් අත්තිකාරම් 2019 දෙසැම්බර් අවසානය දක්වාම නිරවුල් නොකර පැවතුනි. තවද, ව්‍යාපෘතියක් ලෙස සංස්ථාව යටතේ ක්‍රියාත්මක වූ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය (NEMO) සම්බන්ධයෙන් වූ 2017 සහ 2018 වර්ෂවලට අදාළ රු.9,711,161 ක මුදල් අත්තිකාරම් 2019 වර්ෂය අවසානය දක්වාම නිරවුල් නොකර පැවතුනි. | නිරවුල් කිරීමේ ප්‍රමාදය සංස්ථාවේ ආයතනික මට්ටමේ පරීක්ෂාවට ගෙන ඇති අතර වත්මන් අංක 121/1979 චක්‍රලේඛය අනුව සුදුසු ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වේ. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතු බව. |

## 2.2 කාර්ය සාධනය

-------------------

සංස්ථාවේ ප්‍රධාන අරමුණු වනුයේ: (i) ගොඩනැගිලි, සිවිල් ඉංජිනේරු හා අනෙකුත් ඉංජිනේරු ව්‍යාපෘති විමර්ශනය කිරීම, සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම (ii) ව්‍යාපෘති කළමනාකරණ සේවා හා උපදේශන සේවා සැපයීම (iii) දේපල සංවර්ධන කටයුතු අත්පත් කර ගැනීම, (iv) පෙර සූදානම් කළ කොන්ක්‍රීට්, සවි ගැන්වූ කොන්ක්‍රීට් සහ පූර්ව ප්‍රත්‍යාබල කොන්ක්‍රීට් නිෂ්පාදනය කිරීම සහ අලෙවි කිරීම (v) ඉංජිනේරු ව්‍යාපෘති සඳහා අවශ්‍ය හා ඒවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය කිරීම, අලෙවි කිරීම, ආනයනය කිරීම සහ අපනයනය කිරීම (vi) ඉංජිනේරුමය හා ශිල්පීය කාර්ය මණ්ඩලය පුහුණු කිරීම (vii) ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය, ඉදිකිරීම් විධික්‍රම හා ඉදිකිරීම් ශිල්පක්‍රම පිළිබඳ පර්යේෂණ කටයුතු ක්‍රියාවේ යෙදවීම වේ.

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 2019 වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

### 2.2.1 ඉදිකිරීම් උපාංග අංශය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) පෙරසවි අංගනය - රත්මලාන (වැඩබිම් අංක 343)** | | |
| ප්‍රධාන වශයෙන් විකුණුම් රු. මිලියන 10.11 කින් හෝ සියයට 11 කින් අඩුවීම හේතුවෙන් පසුගිය වසරට සාපේක්ෂව ශුද්ධ ලාභය රු. මිලියන 6.27 කින් හෙවත් සියයට 30 කින් අඩු වී තිබුණි. | අදහස් දක්වා නොමැත. | විකුණුම් වැඩි දියුණු කිරීමට පියවර ගත යුතු බව. |
| **(ආ) දංකොටුව වැඩබිම (වැඩබිම් අංක 1099 )** | | |
| ප්‍රධාන වශයෙන් විකුණුම් රු. මිලියන 2.14 කින් හෝ සියයට 14 කින් අඩුවීම හේතුවෙන් ශුද්ධ අලාභය පසුගිය වසරට සාපේක්ෂව රු. මිලියන 2.02 ක් හෙවත් සියයට 17 කින් ඉහළ ගොස් තිබුණි. | අදහස් දක්වා නොමැත. | විකුණුම් වැඩි දියුණු කිරීමට පියවර ගත යුතු බව. |
| **(ඇ) වැලිකන්ද පෙරසවි අංගනය (වැඩබිම් අංක 1738)** | | |
| ප්‍රධාන වශයෙන් විකුණුම් රු. මිලියන 16 කින් හෝ සියයට 86 කින් අඩුවීම හේතුවෙන් ශුද්ධ ලාභය පසුගිය වසරට සාපේක්ෂව රු. මිලියන 7.15 කින් හෙවත් සියයට 397 කින් අඩු වී තිබුණි. | අදහස් දක්වා නොමැත | විකුණුම් වැඩි දියුණු කිරීමට පියවර ගත යුතු බව. |
| **(ඈ) දෙමටගොඩ කොන්ක්‍රීට් සිල්පර අංගනය (වැඩබිම් අංක 1510)** | | |
| ප්‍රධාන වශයෙන් විකුණුම් රු. මිලියන 53.6 කින් හෝ සියයට 19 කින් අඩුවීම හේතුවෙන් ශුද්ධ ලාභය පසුගිය වසරට සාපේක්ෂව රු. මිලියන 4.7 කින් හෙවත් සියයට 109 කින් අඩු වී තිබුණි. | දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ඇණවුම් අඩු වීම නිසා විකුණුම් අඩු වී ඇත. එක් එක් පාර්ශවයන් සමඟ සාධනීය සම්බන්ධතාවයක් යටතේ අනාගතයේදී විකුණුම් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. | විකුණුම් වැඩි දියුණු කිරීමට පියවර ගත යුතු බව. |

**2.2.2 යාන්ත්‍රික හා විදුලි අංශය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) පැලියගොඩ මෙහෙයුම් වැඩබිම (වැඩබිම් අංක 104)** | | |
| වැඩබිමේ ශුද්ධ අලාභය පෙර වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 5.88 කින් හෙවත් සියයට 18 කින් ඉහළ ගොස් තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ඉදිරියේදී පාඩු පියවා ගැනීම සඳහා විකල්ප උපාය මාර්ග ක්‍රියාත්මක කරනු ලැබේ. | ලාභ ලැබීමට පියවර ගත යුතු බව. |
| **(ආ) මොරටුව විශ්ව විද්‍යාලය (වැඩබිම් අංක 6033 )** | | |
| මූලික වශයෙන් ආදායම රු. මිලියන 1,788 කින් හෝ සියයට 13.5 කින් අඩුවීම හේතුවෙන් ශුද්ධ ලාභය පසුගිය වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 2.66 කින් හෙවත් සියයට 62 කින් අඩු වී තිබුණි . | වාර්ෂිකව ආදායම හඳුනා ගැනීම සඳහා උපදෙස් ලබා දෙන ලදී. | ආදායම වැඩි කිරීමට පියවර ගත යුතු බව. |
| (ඇ)මාතලේ පිහිටි ඩොලමයිට් ව්‍යාපෘතියේ නිෂ්පාදන ප්‍රමාණය පෙර වර්ෂවලට සාපේක්ෂව අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් අලාභය රු.මිලියන 9.183 ක් විය. 1992 සිට 2017 දක්වා කාලය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත රු.7,227,099 ක බදු කුලියක් සංස්ථාවට ගෙවීමට ඇති අතර, 2018 වර්ෂය අවසානයට එයින් සංස්ථාව ගෙවා ඇත්තේ රු. මිලියන 1.5 ක් පමණි. මීට අමතරව, කැණීම් සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් ලබාගත් බලපත්‍රය 2018 සිට අළුත් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වැඩ බිමෙහි නිෂ්පාදනය 2020 ජූලි දක්වා අත්හිටුවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | නිෂ්පාදනය ආරම්භ කිරීමට පියවර ගත යුතු බව. |

**(ඇ)ශ්‍රී ජයවර්ධනපුර හෙද පීය ගොඩනැගිල්ල ඉදිකිරීම**

---

ඉහත පීය ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව 2017 ඔක්තෝබර් 04 වන දින රු. මිලියන 7,171.88 ක (වැට් බදුවලින් තොරව) කොන්ත්‍රාත්තුවක් ලෙස සංස්ථාවට ප්‍රදානය කරන ලදී.
මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| **(i)** | සේවාදායකයා සහ සංස්ථාව අතර කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | දෙපාර්ශවය සමඟ ගිවිසුමක් ඇති කර ගැනීමට කාලය වෙන් කරන තෙක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට සහතික කරන ලද ලිපියක් ලබා දෙන ලදී. තවද, ගිවිසුම් මුදල නිශ්චය කිරීම ඕනෑම ගිවිසුමක වැදගත්ම අයිතමය වන බව ඔබට පැහැදිලි කරන අතර ගිවිසුම අත්සන් කරන තුරු ප්‍රදාන ලිපිය යනු ඕනෑම නඩු විභාගයකදී ඉදිරිපත් කළ හැකි ලේඛනයකි. | ගිවිසුම්වලට එළඹීමට පියවර ගත යුතු බව. |
| **(ii)** | විස්තරාත්මක ප්‍රමාණපත්‍ර සකස් නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ පිරිවැය ඇස්තමේන්තුවක් ලබා ගත නොහැකි විය. එබැවින්, සංස්ථාව විසින් පිරිවැය නිසි ලෙස තක්සේරු නොකර මෙම ව්‍යාපෘතිය සිදු කර ඇති බව නිරීක්ෂණය විය. | ඉහත ව්‍යාපෘතිය සඳහා විස්තරාත්මක ප්‍රමාණපත්‍ර සකස් කර විගණකවරුන් වෙත යොමු කර ඇත. | ප්‍රමාණපත්‍ර සකස් කිරීමට පියවර ගත යුතු බව. |
| **(iii)** | උපදේශක විසින් එවන ලද අංක CB/AGM/SPI/HW/C1247/1 දරන හා 2019 සැප්තැම්බර් 10 දිනැති ලිපියට අනුව ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ දින සිට වර්ෂ දෙකහමාරක් සම්පූර්ණ කිරීමෙන් පසුව එනම් 2019 සැප්තැම්බර් 10 වන විට කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය | ව්‍යාපෘතිය ආරම්භයේ දීම සේවාදායකයාගේ පාර්ශවයෙන් ගෙවීම් ප්‍රමාද වූ බව තහවුරු කර ගන්නා ලදි. තවද, ගොඩකිරීමේ ක්‍රමවේදය හඳුනා ගැනීමට ගතකල | ප්‍රගතිය තවදුරටත් වැඩිදියුණු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| සියයට 05 කි. කෙසේ වුවද, ව්‍යාපෘතිය 2020 පෙබරවාරි 22 හෝ ඊට පෙර අවසන් කළ යුතුව තිබුණි. සැබෑ ප්‍රගතිය අපේක්ෂිත ප්‍රගතියට වඩා බොහෝ පසුපසින් තිබෙන බව අනාවරණය විය. | කාලය ද කොන්ත්‍රාත් කාලය තුළ සිදු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉතිරි සීමිත කාල සීමාව සඳහා භාණ්ඩාගාරයෙන් මසකට රු.මිලියන 800 ක් මූල්‍යකරණය කිරීම, වත්මන් ආර්ථික තත්වය තුළ අසීරු කාර්යයක් වී ඇත. | |
| **(iv)** උපදේශක විසින් එවන ලද අංක CB/AGM/SPI/HW/C1247/1 දරන හා 2020 පෙබරවාරි 06 දිනැති ලිපියට අනුව, 2018 මාර්තු සිට 2019 මාර්තු දක්වා කාලය තුළ සංස්ථාව විසින් රු.මිලියන 995 ක අත්තිකාරම් ලබාගෙන තිබුණි. කෙසේ වුවද, සංස්ථාව විසින් කරන ලද වැඩ වටිනාකම රු. මිලියන 537 ක් පමණි. එම අත්තිකාරම් සංස්ථාවේ වෙනත් කටයුතු සඳහා යොදාගෙන ඇති බව නිරීක්ෂණය විය. | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ නිසි ලිඛිත අවසරය ඇතිව සංස්ථාව ස්ථාපිත ව්‍යාපාරය කුමක් වුවත්, ශ්‍රම හෝ ද්‍රව්‍ය පිරිවැය ආවරණය වන පරිදි ගෙවීම් සඳහා අදාළ ව්‍යාපෘති මුදල් සමාන ගෙවීම් අරමුණු සඳහා යොදා ගන්නා ලදී. | උපදේශන කටයුතු සඳහා වූ උපදේශන අත්තිකාරම් පිළිබඳව සංස්ථාවේ කළමනාකාරිත්වය අවධානය යොමු කළ යුතු බව. |

**2.3 සංස්ථාවේ මුදල් ප්‍රවාහය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විගණනය සඳහා ලබා දී ඇති තොරතුරු අනුව, ඉදිකිරීම් අංශය, ඉදිකිරීම් උපාංග අංශය, යාන්ත්‍රික හා විදුලි අංශය, විශේෂ මෙහෙයුම් අංශය සහ උපදේශන අංශය 2019 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු.51,243,748, රු.25,628,858, රු.305,927,727, රු.101,110,904 සහ රු.222,091,810 ක සෘණ මුදල් ප්‍රවාහයක් දක්වා තිබුණි. | එහි පවත්වා ගෙන යනු ලබන සෘණ මුදල් ප්‍රවාහය සඳහා මූල්‍යණය කරනු ලැබුවේ ලංකා බැංකුවෙන් ලබාගත් ණය මුදලෙනි. | සංස්ථාව විධිමත් කාරක ප්‍රාග්ධන කළමනාකරණය සහ මුදල් ප්‍රවාහ කළමනාකරණය පවත්වා ගැනීමට පියවර ගත යුතු බව. |

| | | |
|---|---|---|
| **(ආ)** ලංකා බැංකුවෙන් රු.මිලියන 50 ක තාවකාලික අයිරාවක් ලැබීම සහ මහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 150 ක ප්‍රදානයක් ලැබීම හේතුවෙන් මැයි සහ නොවැම්බර් මාසවල ධනාත්මක ශුද්ධ මුදල් ප්‍රවාහයක් දක්වා තිබුණි. | ධනාත්මක මුදල් ප්‍රවාහය නිරූපනය වී ඇත්තේ ලැබිය යුතු බිල්පත් මත භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්මේන්තුවෙන් ලබාදුන් ප්‍රදානය මත වන අතර එය 2019 දී නියමිත දිනට නිරවුල් විය. | සංස්ථාව විධිමත් කාරක ප්‍රාග්ධන කළමනාකරණය සහ මුදල් ප්‍රවාහ කළමනාකරණය පවත්වා ගැනීමට පියවර ගත යුතු බව. |

## 2.4 ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ (NEMO) මෙහෙයුම් කටයුතු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** රු.812,820,217 ක් වටිනා ජාතික යොවුන් සේනාංක ව්‍යාපෘති 73 ක් ක්‍රියාත්මක නොවන බවට වර්ගීකරණය කර දක්වා තිබුණි. | දිවයිනේ විසිරී ඇති ජාතික යොවුන් සේනාංක වෙත අයත් ගොඩනැගිලි 104 ක් පමණ කැබිනට් තීරණයට අනුව ටෙන්ඩර් පටිපාටියට පටහැනිව සිදුකර ඇති අතර එමගින් බැඳුම්කර / ඇපකර නිදහස් කර අත්තිකාරම් ලබා ගැනීමට ඉඩ ලබා දී ඇත. කෙටි කොන්ත්‍රාත් සඳහා ඉඩ දී තිබීම හේතුවෙන් දිවයිනේ විවිධ ප්‍රදේශවල ස්ථාන 25 ක විවිධ ස්ථානවල ස්ථාපිත කිරීමට හා පරිපාලනය කිරීම NEMO හි ව්‍යාපාරික කටයුතුවලින් ඔබ්බට ගිය කටයුත්තක් හෙයින් තාක්ෂණික කාර්ය මණ්ඩලය සොයා ගැනීමේදී NEMO බරපතල තත්වයකට මුහුණ දී තිබේ. මේ ආකාරයේ මෙහෙයුම්වලින් කොටසක් උප කොන්ත්‍රාත්කරුවන්ගේ අධීක්ෂණය මගින් වෙන් කර තිබුණද පරිපාලන කොටස අපේක්ෂිත මට්ටමේ සැලසුම් සහගත කාර්යසාධනයක් දක්වා නොතිබුණි. ව්‍යාපෘතියේ බහුතර කොටසක් ශුන්‍ය ප්‍රතිශතයක් වීම හේතුවෙන්, එය ක්‍රියාත්මක නොවන ලෙස සලකනු ලබන අතර එහි ප්‍රතිඵලයක් ලෙස කැබිනට් අමාත්‍ය මණ්ඩලයේ තීරණයත් සමඟ ව්‍යාපෘති ඉවත් කර ගන්නා ලදී. එබැවින් නිම කිරීමේ කටයුතු ඒ පිළිබඳ උනදුවක් දක්වන පාර්ශවයන් විසින් සිදු කරනු ලැබේ. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකාරිත්වය අවධානය යොමු කළ යුතු බව. |
| **(ආ)**2017 වර්ෂයේදී ව්‍යාපෘති 22 ක් සඳහා රු. 23,335,967 ක් ජංගම අත්තිකාරම් ලබාගෙන තිබුණද, ඔවුන්ගේ වැඩ 2019 දෙසැම්බර් 31 වන විට ද ආරම්භ කර නොතිබුණි. | | ව්‍යාපෘති ආරම්භ කිරීමට පියවර ගත යුතු බව. |
| **(ඇ)**ක්‍රියාත්මක නොවන ව්‍යාපෘති 82 න් ව්‍යාපෘති 24 ක් 2019 දෙසැම්බර් 31 දිනට හෝ ඊට පෙර නිම කළ යුතුව තිබුණි. කෙසේ වුවද, එම ව්‍යාපෘතිවල ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු විය. | | ප්‍රගතිය වැඩි දියුණු කිරීමට පියවර ගත යුතු බව. |
| **(ඈ)**සමාලෝචිත වර්ෂය අවසානයේදී අගය රු.241,378,424 ක් වන මෙහෙයුම් ව්‍යාපෘති 06 ක් සම්පූර්ණ කළ යුතු වුවද, ඔවුන්ගේ කටයුතු 2019 දෙසැම්බර් 31 වන විට ද ආරම්භ කර නොතිබුණි. කෙසේ වුවද, එම ව්‍යාපෘති 03 ක් සඳහා දැනටමත් රු.29,269,917 ක ජංගම අත්තිකාරම් ලබාගෙන තිබුණි. | | ව්‍යාපෘති නිම කිරීමට පියවර ගත යුතු බව. |
| **(ඉ)**වටිනාකම රු.586,937,590 ක් වූ ව්‍යාපෘති 24 ක් සම්බන්ධයෙන් ව්‍යාපෘති නිම කිරීමේ කාලය දැනටමත් අවසන් වී තිබුණද, 2020 ජුනි 30 වන විට එම ව්‍යාපෘතිවල සත්‍ය ප්‍රගතිය සියයට 75 ට වඩා අඩු විය. | | ප්‍රගතිය වැඩි දියුණු කිරීමට පියවර ගත යුතු බව. |

| | | |
|---|---|---|
| (ඊ) එකතු කළ අගය මත බදු (VAT), ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT), ආර්ථික සේවා ගාස්තු (ESC) පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. එබැවින්, එම බදු වල ගෙවිය යුතු ශේෂයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | VAT, NBT සහ ESC සම්බන්ධ තොරතුරු නියමිත කාලයේදී විගණනය වෙත යවනු ලැබේ. | ගෙවිය යුතු ශේෂයන් සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීම සහ පිළිගැනීම සඳහා විගණනය වෙත විස්තරාත්මක උපලේඛන ලබාදිය යුතු බව. |
| (උ)NEMO මගින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු VAT සහ NBT පිළිවෙලින් රු.මිලියන 123.84 ක් සහ රු. මිලියන 7.8 ක් ප්‍රේෂණය කිරීමට සංස්ථාව වෙත ලබා දී නොතිබුණි . | 2020 තෙවන කාර්තුව අවසන් වීමට පෙර VAT සහ NBT CGIR වෙත ප්‍රේෂණය කිරීමට පියවර ගෙන තිබේ. | බදු ප්‍රේෂණය කිරීමට පියවර ගත යුතු බව. |
| (ඌ)2002 සිට 2011 දක්වා කාලය තුළ ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.මිලියන 235.8 ක මුදලක් ගෙවා නොතිබුණි. | NEMO සහ NHDA අතර පවත්වා ගෙන යනු ලබන පාලන ගිණුම නැවත සලකා බලා ගෙවීම් කිරීම කරනු ලැබේ. | සෑම දිගුකාලීන වගකීම් ශේෂයක්ම ප්‍රමාදයකින් තොරව නිරවුල් කිරීමට පියවර ගත යුතු බව. |
| (එ)NEMO සඳහා අනුමත සේවක සංඛ්‍යාව 344 ක් වුවද, 2019 දෙසැම්බර් 31 දිනට සත්‍ය සේවක සංඛ්‍යාව 591 ක් විය. 247 ක්වූ අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව NEMO විසින් නව තනතුරු 23 ක් නිර්මාණය කර ඇති අතර අනුමත නොකරන ලද මෙම තනතුරු සඳහා සේවකයින් 62 ක් බඳවාගෙන තිබුණි. | මේ සම්බන්ධයෙන් කළමනාකරණ කමිටුවට නිර්දේශ කිරීම සඳහා කමිටුවක් පත් කරන ලදී. | අනුමැතිය ලබා ගැනීමට පියවර ගත යුතු බව. |

## 2.5 හඳුනා ගන්නා ලද පාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|
| 2014 සිට 2019 දක්වා ආදායම් බදු, අගය එකතු කළ බද්ද, ආර්ථික සේවා ගාස්තු, ජාතිය ගොඩනැගීමේ බද්ද සහ GST බදු මුදල් පිළිවෙලින් | 2020 වර්ෂය තුළ ක්‍රියාත්මක වන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ පුනර්ජීවන වැඩසටහනට සමගාමීව මුදල් අමාත්‍යාංශයේ, සහ රේඛීය අමාත්‍යාංශයේ සහාය ඇතිව | බදු නීතියට අනුව බදු ප්‍රේෂණය කිරීමට පියවර ගත යුතු බව. |

| | | |
|---|---|---|
| රු.10,562,227, රු.897,465,953, රු.97,745,734, රු.17,204,806 සහ රු.25,683,053 ක් ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රු. 161,703,053 ක අධිභාරයක් පනවා තිබුණි. | බදු ගෙවීමට වඩා බදු නිදහස් කිරීමට විකල්ප ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක වෙමින් පවතී. ඊට සමගාමීව ආදායම් බදු කොමසාරිස් ජනරාල් සමඟ හිඟ සඳහා මාස 6 ක සහන කාලයක් පිළිබඳව සාකච්ඡාවක් පැවැත්වූ අතර 0% ක දඩයක් යෝජනා විය. | |

**2.6 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 ජනවාරි සිට 2015 ජූලි දක්වා කාලය තුළදී සේවකයින් සඳහා ගෙවා තිබූ ජීවන වියදම් දීමනාවට අදාළ දායක මුදල් අදාළ ගණනය කිරීමේදී සලකා නොතිබුණි. ඒ සඳහා දායක විය යුතු වන රු. මිලියන 307.82 ක් හා රු. මිලියන 41.97 ක් සංස්ථාව විසින් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට රු. මිලියන 171.22 ක් සහ රු. මිලියන 20.98 ක් අධිභාර ගෙවිය යුතුව තිබුණි. | අදාළ වගකීම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් මූලික වශයෙන් පිළිගනු ලැබේ. අභ්‍යන්තර විගණන පරීක්ෂණවලින් පුද්ගල ගණනය කිරීම්වල යම් යම් විෂමතාවන් අනාවරණය වූ අතර එය සාමාජිකයින්ගේ පෞද්ගලික උනන්දුව කෙරෙහි බලපායි. එබැවින්, ආයතනයට හෝ සාමාජිකයෙකුට හෝ අලාභයක් නොවන ලෙස දෝෂ ශූන්‍ය / අවම වන තෙක් විගණන පරීක්ෂණ පුළුල් කළ යුතුය. මේ අතර ප්‍රේෂණ සඳහා අරමුදල් සම්පාදනය කරනු ලබන්නේ රජය මගිනි. | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සහ 1980 අංක 46 දරන සේවක භාර අරමුදල් පනත ප්‍රකාරව පියවර ගත යුතු බව. |

**2.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බිල්පත් කටයුතු අවසන් කිරීමේදී මාර්ග වැඩ වල භාවිත කර ඇති ප්‍රමාණ පිළිබඳ මිනුම් වෙනස හේතුවෙන්, ගාල්ල දිස්ත්‍රික්කයේ පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට අදාළව කොන්ත්‍රාත්කරුවන් 30 දෙනෙකුගෙන් ලැබිය යුතු ශේෂය රු. 61,851,213 ක් අය කර ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ලැබිය යුතු ශේෂයන් කිසිදු ප්‍රමාදයකින් තොරව අය කර ගත යුතු බව. |
| (ආ) | සංස්ථාවේ නිලධාරීන් 16 දෙනෙකු විසින් අනුමත කරන ලද ඉන්ධන ප්‍රමාණය ඉක්මවා | සභාපතිවරයා විසින් නිකුත් කරන ලද 2015 නොවැම්බර් 18 දිනැති අංක | අනුමැතිය ලබා ගැනීමට පියවර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | යාම නිසා ඉන්ධන පරිභෝජනය සඳහා අමතර වියදම් රු.1,233,480 ක් දරා තිබුණි. එසේම, වර්ෂය තුළදී නිලධාරීන් 03 දෙනෙකු සඳහා NEMO විසින් දරන ලද මුළු ඉන්ධන වියදම රු. 530,971 ක් විය. | CH/SEEC/2015/14 චක්‍රලේඛයට අනුව ප්‍රවාහන පහසුකම් සඳහා සුදුසුකම් ලබන කාර්ය මණ්ඩලයට ඉන්ධන නිකුත් කිරීමේදී පදනම් කර ගෙන ඇත. | |
| **(ඇ)** | ඊට අතිරේකව ප්‍රවාහන පහසුකම් සඳහා හිමිකම් නොමැති ප්‍රවාහන නිලධාරියා සඳහා වර්ෂය තුළ දරන ලද ඉන්ධන වියදම රු .543,085 කි. | එකඟ වේ. PED 1/2015 චක්‍රලේඛයේ කොන්දේසි පිළිපැදීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛය අනුව පියවර ගත යුතු බව. |

## 2.8 නිෂ්ක්‍රීය වත්කම්

-----------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද සංස්ථාවට අයත් සී-සිටි ව්‍යාපෘතියේ ඉඩම සහ ගොඩනැගිල්ල අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගෙන නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වන වගන්තිය යටතේ පළාත් පාලන බලධාරීන් විසින් crown land ඉඩමක් ලෙස නිශ්චිත ඉඩම් කොටස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත වෙන් කර ඇති බව, ඉඩමේ අයිතිය නිරවුල් කිරීමේ දී සාකච්ඡා විය. එබැවින් අදාළ සියලු ලියකියවිලි අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත. | වත්කම් උපයෝජනය කිරීමට පියවර ගත යුතු බව. |
| **(ආ)** | සංස්ථාවට අයත් ඇලුමිනියම් බාර් සහ සිවිලිං ෂීට් තොගය ප්‍රයෝජනයට නොගෙන 2017 සිට NEMO හි ප්‍රධාන වෙළඳසැල්වල ප්‍රධාන ගබඩාවල පැවතුනි. | ඒවා ආර්ථික වශයෙන් උපයෝජනය කිරීම ව්‍යාපෘති නිලධාරීන්ගේ වගකීම වේ. සාමාන්‍යාධිකාරී විසින් පත් කරන ලද කමිටුවක් විසින් සත්‍යාපනයට යටත්ව ද්‍රව්‍ය ඇලුමිනියම් වැඩබිමට එක් කිරීම නිර්දේශ කෙරේ. | වත්කම් උපයෝජනය කිරීමට පියවර ගත යුතු බව. |

## 2.9 ව්‍යාපෘති ප්‍රමාද වීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **ඉදිකිරීම් අංශය** | | |
| **(i)** | 2018 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 237.27 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත ව්‍යාපෘති 03 ක් නිම කිරීමට අපේක්ෂිතව පැවතුණි. කෙසේ වුවද, එම ව්‍යාපෘති 2020 ඔක්තෝබර් 31 වනවිට ද අවසන් කර නොතිබුණි. | නියමිත කාලයේදී කාර්යය අවසන් කිරීම සඳහා වැඩබිම් වියදම් පියවා ගැනීමට මූලික හා අතුරු මුදල් ප්‍රවාහය ප්‍රමාණවත් නොවේ. | කාල සීමාව තුළ ව්‍යාපෘති නිම කිරීමට පියවර ගත යුතු බව. |
| **(ii)** | රු.මිලියන 884.66 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත ව්‍යාපෘති 4 ක් 2019 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට ඉලක්ක කර තිබුණද, ඒවායේ සත්‍ය ප්‍රගතිය 2020 ඔක්තෝබර් 31 වනවිට ද සියයට 80 ට වඩා අඩු විය. | නියමිත කාලයේදී කාර්යය අවසන් කිරීම සඳහා වැඩබිම් වියදම් පියවා ගැනීමට මූලික හා අතුරු මුදල් ප්‍රවාහය ප්‍රමාණවත් නොවේ. | ප්‍රගතිය තවදුරටත් වැඩිදියුණු කිරීමට පියවර ගත යුතු බව. |
| **(iii)** | රු.මිලියන 8,851.35 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත ව්‍යාපෘති හතරක නිමකිරීමේ ප්‍රගතිය 2020 ජූලි 30 වන විට අපේක්ෂිත ඉලක්කයට ප්‍රතිරූපීව සියයට 50 ට වඩා අඩු විය. | නියමිත කාලයේදී කාර්යය අවසන් කිරීම සඳහා වැඩබිම් වියදම් පියවා ගැනීමට මූලික හා අතුරු මුදල් ප්‍රවාහය ප්‍රමාණවත් නොවේ. | ප්‍රගතිය තවදුරටත් වැඩිදියුණු කිරීමට පියවර ගත යුතු බව. |
| **(ආ)** | **ඉදිකිරීම් උපාංග අංශය** | | |
| **(i)** | සමාලෝචිත වර්ෂය තුළදී නිම කිරීමට ඉලක්ක කර තිබුණද, රු. මිලියන 743.01 ක් වන අංක 2292 දරන ව්‍යාපෘතියේ සත්‍ය ප්‍රගතිය 2020 ඔක්තෝබර් 31 වන විට සියයට 77 ක් විය. | බිල්පත් පියවීම ප්‍රමාදවීම විශේෂිත සැපයුම් සඳහා මූල්‍යකරණය වෙනස් වීම ප්‍රධාන වශයෙන් හේතුවේ. එය ව්‍යාපෘතියේ ප්‍රගතියට බලපාන බැවින් කොන්ත්‍රාත්කරුගේ (SEC) පාලනයෙන් තොර වේ. | ප්‍රගතිය තවදුරටත් වැඩිදියුණු කිරීමට පියවර ගත යුතු අතර ප්‍රමාදය ඉවත් කිරීමට පියවර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | වටිනාකම රු.මිලියන 575 ක් වූ අංක 2323 දරන ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට ඉලක්ක කර තිබුණ ද, එහි සත්‍ය ප්‍රගතිය 2020 ඔක්තෝබර් 31 දින වනවිට සියයට 23 ක් විය. | කොන්ත්‍රාත් පරිපාලනය අහිතකර ලෙස සේවාදායකයින්ගේ ආයතන හා වැඩබිම්වල ක්ෂේත්‍ර වැඩවල ප්‍රායෝගික දෝෂ එනම් වැඩබිමට යාමට ගතවන කාලය, යෝජිත කොන්ත්‍රාත් වැඩ ක්‍රියාත්මක කිරීම සඳහා භූමියේ ඉඩ ප්‍රමාණයක් අවශ්‍යවීම වැනි හේතූන් කොන්ත්‍රාත්කරුගේ කළමණාකරණය කළ හැකි මට්ටමින් පරිබාහිර කරුණු වේ. | ප්‍රගතිය තවදුරටත් වැඩිදියුණු කළ යුතු බව. |

**2.10 සම්පත් වෙනත් ආයතන වෙත මුදා හැරීම**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක PED / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මාර්ගෝපදේශ 8.3.9.හි දක්වා ඇති උපදෙස්වලට පටහැනිව සංස්ථාවේ සේවකයින් තිස් එක් දෙනෙකු (31) නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය, පළාත් අමාත්‍යාංශ, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රජයේ කර්මාන්තශාලාව සහ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත මුදා හැර තිබුණි. තවද, චක්‍රලේඛයට අනුව, එවැනි සේවකයින්ගේ වැටුප් අදාළ ආයතනවලින් ප්‍රතිපූරණය කළ යුතුය. කෙසේ වෙතත්, සංස්ථාව විසින් දරන ලද රු.13,152,091, රු.961,574 සහ රු.297,570 ක වැටුප් ප්‍රතිපූරණය කිරීම සේවකයින් 04 දෙනෙකු සඳහා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් ප්‍රතිපූරණය කර නොමැති අතර 2020 මැයි 31 දක්වාත් පිළිවෙලින් සේවකයින් 06 | එක් එක් අයගේ මාසික වැටුප් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ ඉල්ලීමට ගරු කිරීමක් වශයෙන්, දක්වා ඇති සේවකයින් අදාළ රජයේ ආයතන වෙත මුදා හැර ඇති අතර, එකතු කිරීම් සිදුකරමින් පවතින අතර නිරතුරුව අධීක්ෂණය කරනු ලැබේ. | අදාළ රජයේ ආයතනයෙන් වැටුප් ප්‍රතිපූරණය කිරීමට පියවර ගත යුතු බව. |

දෙනෙකු සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සහ සේවකයින් 02 දෙනෙකු සඳහා රජයේ කර්මාන්ත ශාලාව වැටුප් ප්‍රතිපූරණය කර නොතිබුණි.

## 2.11 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංස්ථාව විසින් 2006 සිට 2019 දක්වා ඉහළ වැටුප් තලයන් යටතේ පරිමාණයකින් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 05 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 28 දෙනෙකු බඳවා ගෙන තිබුණි. තවද, 2018 සහ 2019 යන වර්ෂවලදී ප්‍රමාණ සමීක්ෂකවරු 15 දෙනෙකු, සැලසුම් ශිල්පී 08 දෙනෙකු සහ සුපරීක්ෂකවරු (සිවිල්) 26 දෙනෙකු ද කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබුණි. | බඳවා ගැනීමේ දී අදාළ බඳවා ගැනීම් පටිපාටිය අදාළ කරගෙන තිබුණි. තෝරාගත් අයදුම්කරුවන් ස්ථිර පදනමක් මත වර්තමාන වැටුප් පියවරයන් සඳහා එකඟ වීමට කිසිදු කැමැත්තක් නොතිබුණි. එබැවින් එවැනි ඉහළ කළමනාකරණ තනතුරුවල සේවාවන්හි අවශ්‍යතාවය මත කොන්ත්‍රාත් පදනම මත පත්වීම් ප්‍රදානය කරන ලදී. තවද, සංස්ථාවේ ස්ථාවර පිරිවැය අඩු කිරීම සඳහා ඉදිකිරීම් ව්‍යාපෘතිවල කාර්ය මණ්ඩලය සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සිදු කරන ලදී. | බඳවා ගැනීම් පටිපාටියට අනුකූලව ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමට බඳවා ගැනීමට පියවර ගත යුතු බව. |
| (ආ) | ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 1.2 වන වගන්තියට අනුව, පත්වීමක් කළ යුත්තේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා පමණක් වුවද ඊට පටහැනිව, 2019 දෙසැම්බර් 31 දින වන විට අනුමත සේවක තනතුරු 33 ක් සඳහා අතිරේක සේවකයින් 525 ක් පත් කර තිබුණි. | තනතුරු 03 ක් සඳහා ප්‍රතිපාදන අනුමත කර නොමැත. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා නැවත සේවයේ පිහිටුවා ඇති අතර එක් තනතුරක් පුද්ගලයන්ට පමණක් සීමා විය. පලපුරුදු ඇති අයෙකු සංස්ථාවේ නොමැති වීම හේතුවෙන් තවත් තනතුරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇත. | ආයතන සංග්‍රහයට අනුකූල වීමට පියවර ගත යුතු බව. |
| (ඇ) | 2006 අගෝස්තු 01 දිනැති අංක 28 (ii) කළමනාකරණ සේවා චක්‍රලේඛයට සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2009 නොවැම්බර් 25 දිනැති අංක ඩීඑම්එස්/ඊ3/43/4/265/1 ලිපිය අනුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සංස්ථාවේ පුරප්පාඩු පිරවීම හෝ නව තනතුරු ඇති කිරීම නොකළ යුතුය. කෙසේ වුවද, එම විධිවිධානය නොසලකා හරිමින් සංස්ථාව විසින් අනුමත නොකළ තනතුරු සඳහා සේවකයින් 06 සිට 08 දෙනෙකු දක්වා අනුමත කර ඇත | | අනුමැතිය ලබා ගැනීමට පියවර ගත යුතු බව. |

**2.12 වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක PED/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව 2016, 2017 සහ 2018 යන වර්ෂවල වාර්ෂික වාර්තා 2016 ජූලි 20 වන විට ද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නිමකිරීම 2003 ජුනි 02 දිනැති අංක PED / 12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව නියමිත දිනට සිදුකළ යුතු බව ප්‍රායෝගිකව වටහාගෙන ඇත. සියලුම මූල්‍ය වාර්තාකරණ කටයුතු නියමිත දිනට ඉටු කිරීමට සමගාමීව පෙළගස්වා ඇත. ඒ අනුව, විගණනය කරන ලද ගිණුම් වාර්තා විගණන වාර්තාව සමඟ ඉදිරිපත් වූ පසු වාර්ෂික වාර්තාව සකස් කරනු ලැබේ. | චක්‍රලේඛය අනුව පියවර ගත යුතු බව. |